**වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීම සඳහා අතිරේක මූල්‍යයනය ව්‍යාපෘතිය - 2017**

---

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීම සඳහා අතිරේක මූල්‍යයනය ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි අංක 5445-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජල සම්පත් මණ්ඩලය පළාත් සභා සහ ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ විශාල වේලි මෙහෙයුම් හා නඩත්තු කිරීම සඳහා දිගු කාලීන තිරසාර වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම සහ ජල සම්පත් සැලසුම්කරණය වැඩිදියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,154 කට සමාන එජඩො මිලියන 84.50 ක් වන අතර ඉන් රු.මිලියන 10,956 කට සමාන එජඩො මිලියන 83 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ඔක්තෝබර් 23 දින ආරම්භ කරන ලද අතර 2018 මැයි 15 වනවිට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) මූල්‍ය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඔ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

වත්කම් කිහිපයක් ඍජුව ව්‍යාපෘතියේ සංරචක පිරිවැය යටතේ දැක්වා ඇති හෙයින් 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.මිලියන 674.48 ක් වූ දේපල, පිරියත හා උපකරණ පිරිවැය ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන එකතුව රු.මිලියන 802.48 ක් වූ අනුරූපී වත්කම්වල පිරිවැය සමඟ ගැලපී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 83.00 | 10,956.0 | 3,880.0 | 19.6 | 2,983.1 | 59.5 | 8,666.4 |
| ශ්‍රී ලං ර | 1.50 | 198.0 | 40.0 | 0.2 | 34.0 | 0.4 | 57.5 |
| | 84.50 | 11,154.0 | 3,920.0 | 19.8 | 3,017.1 | 59.9 | 8,723.9 |

### 3.2 භෞතික ප්‍රගතිය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ වැඩ සැලැස්ම අනුව, වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතේ වූ ජලාශ 15 ක වේලි, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වූ ජලාශ 10 ක වේලි, උතුරු පළාත් සභා විෂය පථය යටතේ වූ ජලාශ 03 ක වේළි, ලංකා විදුලි බල මණ්ඩලයේ විෂය පථය යටතේ වූ ජලාශයක වේල්ල හා මහනුවර නගර සභා විෂය පථය යටතේ වූ වේලි 02 ක පිළිසකර කිරීමේ කාර්යයන් 2017 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. මේ අතරින්, 2017 දෙසැම්බර් 31 දින වන විට වාරි මාර්ග දෙපාර්තමේන්තු විෂය පථය යටතේ වූ වේලි 08 ක්, මහවැලි අධිකාරිය යටතේ වූ වේලි 05 ක් සහ අනෙකුත් ආයතනවල විෂය පථය යටතේ 01 බැගින් වූ වේලිවල පිළිසකර කිරීමේ කාර්යයන් අවසන් කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31දින වන විටත් වාරි මාර්ග දෙපාර්තමේන්තු විෂය පථය යටතේ වූ අවසන් නොකල පිළිසකර කාර්යයන් සඳහා දින දීර්ඝ කිරීමක් සිදුකර නොතිබුනු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ආ) 2015 ජුනි 30 දින තෙක් මීට පෙර ක්‍රියාත්මක වූ වේලි ආරක්ෂණ ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතියේ කාලය අවසන් වන විට වැඩ අවසන් නොකල සමහර ව්‍යාපෘතිවල පිළිසකර කාර්යයන් මෙම ව්‍යාපෘතියට මාරු කර තිබුණද, ලැබී ඇති තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යයන් අවසන් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) පෙර වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ 01 (එන්) පරිච්ඡේදය පරිදි පොල්ගොල්ල උමගේ සිදුකල යුතු පිළිසකර කාර්යයන් හඳුනාගැනීමට අවශ්‍ය කළ පර්යේෂණ කටයුතු සිදුකිරීම මෙම ව්‍යාපෘතියට පවරා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යයන් ආරම්භ කර නොතිබුණි.

(ii) පෙර ව්‍යාපෘතියෙන් පවරා තිබූ රු.මිලියන 14 ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන සඳහා මිලදී ගත යුතු සොරව් බැරල් (Sluice barrel) පරීක්ෂණ උපකරණ ප්‍රසම්පාදන කටයුතු අතරමග නවතා දමා තිබුණි. තවද, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානයේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2017 වර්ෂයේ වෙන්කර තිබූ රු.මිලියන 30 මගින් සිදුකල යුතු කාර්යයන්ද අතරමග නවතා දමා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙහිඅත්තකණ්ඩිය මුවගම්මන ජලාශයේ වේල්ලේ පිළිසකර කාර්යයන් නිමකිරීම සඳහා 2018 මාර්තු දක්වා කාලය දීර්ඝ කර තිබුණද, 2018 මාර්තු 08 දින සිදුකල ස්ථාන පරීක්ෂාවේදී කොන්ත්‍රාත්තුව යටතේ විශාල කාර්යයන් වන වේල්ලේ සිවිල් ඉදිකිරීම් කාර්යයන්, වේල්ල මත මාර්ගයේ (Dam crest road) පුනරුත්ථාපන කාර්යයන්, සොරොව් ගේට්ටු අළුත්වැඩියා කටයුතු, පිටවීම් මහ ව්‍යුහය අළුත්වැඩියාව හා ඇල මාර්ගය වෙනත් ශාඛා ඇළ මාර්ග 02 කට සම්බන්ධ කිරීම, නඩත්තු මාර්ගය හා පහත කොටසේ පෙරණය (Toe Filter) ඉදිකිරීම, පරීක්ෂණ අඩි පාර හා ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම ආදිය එදිනට ආරම්භ කර නොතිබුණි. මේ නිසා, අදාල කාර්යයන් කාල දිගුව තුල අවසන් කිරීම සඳහා වන හැකියාව අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පොල්ගොල්ල වේලි හා ජලාශ කළමනාකරණ මධ්‍යස්ථානයේ පවතින ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම හා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2016 නොවැම්බර් 24 දින රු.මිලියන 262.09 ක ඇස්තමේන්තු පිරිවැයකට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද, වර්තමානයේ එම පරිශ්‍රයේ පදිංචි වී ඇති පාර්ශවය එම ගොඩනැගිල්ලෙන් ඉවත් වීම ප්‍රතික්ෂේප කර ඇති නිසා 2017 දෙසැම්බර් 31 දින වන විට එම කොන්ත්‍රාත්තු කාර්යයන් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) අනුරාධපුර ජල සම්පත් මධ්‍යස්ථානයේ නව රසායනික පරීක්ෂණාගාරය සඳහා අවශ්‍ය රසායන උපකරණ මිලදී ගැනීම හා ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රසම්පාදන සැලසුමේ රු.මිලියන 113.54 ක් වෙන්කර තිබුණු අතර, 2018 මැයි 31 වන විට එහි කටයුතු අවසන් කර ඇති බව ව්‍යාපෘතිය වාර්තා කර තිබුණද, එදින වන විටත් එහි කාර්යයන් අවසන් කර නොතිබුණි.

## 3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්

------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 මැයි 16 දින ඉදිකිරීම් වැඩ අවසන් කර තිබූ පිරිවැය රු.මිලියන 25.17 ක් වූ ජාතික වේලි ආරක්ෂණය සඳහා වන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2017 දෙසැම්බර් 31 දින වන විටත් බලාපොරොත්තු වූ අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි.

(ආ) පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා වන ගොඩනැල්ල ඉදි නොකිරීම නිසා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ජල තත්ව කළමනාකරණ පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා 2015 දී මිලදීගත් පිරිවැය රු.මිලියන 37.40 ක උපකරණ හා උපාංග 2017 දෙසැම්බර් 31 දින විටත් භාවිතයට ගෙන නොතිබුණි. ඒ අතරින් රු.මිලියන 26.50 ක් වටිනාකම සහිත උපකරණ එදිනට නිෂ්ක්‍රීය වී තිබුණි.

**3.5** **මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු**

**---------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් මිලදී ගත් ස්ථාවර වත්කම් සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2017 මැයි 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතිය විසින් මිලදීගත් පිරිවැය රු. මිලියන 802.50 ක් වූ ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම විශ්වාසදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) 2015 වර්ෂයේ කාර්යයන් අවසන් කළ වේලි ආරක්ෂක හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය මගින් මිලදීගත් පිරිවැය රු.මිලියන 36 ක් වූ ද්විත්ව කාර්ය මෝටර් රථ 03 ක්, පරිගණක, ලී බඩු හා සවිකිරීම් යනාදි වත්කම් මෙම ව්‍යාපෘතිය වෙත පවරා තිබුණි. කෙසේ වුවද, අදාල වත්කම් භාවිතා කලද ව්‍යාපෘතිය එම වත්කම් නැවත අගය කර පොත්වලට ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.